සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

11 ශ්‍රේණිය
தரம் 11
Grade 11

ක්‍රිස්තියානි ධර්මය I පත්‍රය
கிறிஸ்தவம் வினாத்தாள்-I
Christianity Paper I

පැය එකයි
ஒரு மணித்தியாலம்
One Hour

සැලකිය යුතුයි
(i) සියලුම ප්‍රශ්න වල පිළිතුරු සපයන්න
(ii) අංක 1සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුරු තෝරන්න.

1) අන්ධකාරයේ ඇවිද්ද සෙනග දුටුවේ,

i) ආලෝකයක් ii) පහන් ටැඹක් iii) බබළන තාරකාවක් iv) දේදුන්නක්

2) කිතු උපත සිදුවූ සමයේ පලස්තීනය පාලනය කළේ,

i) ග්‍රීක අධිරාජ්‍යය ii) සිරියානු අධිරාජ්‍යය
iii) රෝම අධිරාජ්‍යය iv) බබිලෝනියානු අධිරාජ්‍යය

3) ස්නාවක ජොහාන් ට නම් තැබුවේ ,

i) උත්තම පූජකයාතුමා ii) සෙකරියස් තුමා iii) මරිය තුමිය iv) එලිසබෙත් තුමිය

4) 'රෙදිවලින් ඔතා ගව ඔරුවක සිටින බිළින්දෙක්' යන ලකුණ දුන්නේ,

i) පූජකයන්ට ii) ශාස්ත්‍රවන්තයන්ට iii) එඬේරුන්ට iv) හේවායන්ට

5) දේව සැලැස්ම තේරුම්ගෙන දේව අණට කීකරුවූ ඔහු දේවදූත පණිවිඩයට අවනත වූයේ,

i) ජොහාන් ii) ජෝසෙප් iii) පේදුරු iv) ආබ්‍රහම්

6) හෙරෝද් රජ ස්නාවක ජොහාන් ට තරවටු කොට හිරගෙදරට දමන්නට මුල් වූ කාරණයට සම්බන්ධ වන්නේ,

i) එලිසබෙත් ii) මග්දලායේ මරියා iii) හෙරෝදියස් iv) ජොවන්නා

7) යුදෙව් සමාජය තුළ තෙලින් ආලේප කළ ජේසුස් වහන්සේගේ ජීවිතයේ සනාථ වූ කාර්යයන් (ආකෘතිය) වන්නේ,

i) ධීවර, අයකැමි හා පූජක | ii) පූජක , රජ හා දිවැසිවර

iii) රබ්බි, රජ හා පූජක | iv) ධීවර, අයකැමි හා රජ

8) 'ගර්ජනාවේ පුත්‍රයන්' යන නමින් හඳුන්වන සොයුරන් වන්නේ,

i) සීමොන් හා අන්ද්‍රෑ | ii) කායින් හා ආබෙල්

iii) ජාකොබ් හා ජොහාන් | iv) ජෝසෙප් හා බෙන්ජමින්

9) අන්‍ය ජාතීන් සමඟ මිශ්‍ර වීම නිසා අපවිත්‍ර වූ ජන කොටසක් ලෙස හඳුන්වන් වන්නේ,

i) හෙබ්‍රෙව් ජනතාව ii) සාමාරිත ජනතාව iii) ග්‍රීක ජනතාව iv) මීසරයේ ජනතාව

10) යූදස් කෙරෙහි ජේසුස් වහන්සේ දැක්වූ අනුකම්පාවෙන් හෙළි වූයේ,

i) පාපය මිස පව්කරුවා ප්‍රතික්ෂේප කිරීම ජේසු පිළිවෙත නොවන බවයි

ii) පාපයට හසුවී යහපත ප්‍රතික්ෂේප කිරීම ජේසු පිළිවෙත නොවන බවයි

iii) නිවැරදි දේ තුළින් පාපය ප්‍රතික්ෂේප කිරීම ජේසු පිළිවෙත නොවන බවයි

iv) පව්කරුවා ව සමාව දී වරද ප්‍රතික්ෂේප කිරීම ජේසු පිළිවෙත නොවන බවයි

11) "ඒකාන්තයෙන්ම සමිඳාණන් වහන්සේ නැගිට සිටින සේක" යන ජීවමාන සත්‍ය අත්දැක ප්‍රකාශ කළේ,

i) පේදුරු ii) තෝමස් iii) මග්දලායේ මරියා iv) ක්ලෙයෝපස්

12) ත්‍රිත්වය මනා ලෙස පිළිබිඹු වූ අවස්ථාව වන්නේ,

i) ගෙත්සමනේ උයනේදී ii) රූපවිපර්යාසයේ දී iii) බෞතීස්මයේ දි iv) පාළුකරයේදී

13) ශුද්ධ බයිබලය තුළ වළාපටලය සංකේතවත් කරනුයේ,

i) දේව බලය ii) දේව අභිමුඛත්වය iii) දේව මහිමය iv) දේව ගෞරවය

14) කිතුනු අපගේ ජීවිත වල මූලික අරමුණ විය යුත්තේ,

i) දේව රාජ්‍යය උරුම කරගැනීමයි. | ii) ජේසුස් වහන්සේ හා සම වීමයි.

iii) දේව බලය විඳහා පෑමයි. | iv) දේව කැමැත්ත හඳුනා ගැනීමයි.

15) ජේසුස් වහන්සේ දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමේ දී අනුගමනය කළ ප්‍රධාන ක්‍රමවේදය නම්,

i) දයාවේ ක්‍රියාය ii) ප්‍රාතිහාර්යය iii) ඉගැන්වීමය iv) උපමා කතාය

16) ජුදා ආගමික නීතියට අනුකූලව ගැටළු විසඳීම හා විනිශ්චයන් ලබාදීම සඳහා ස්ථාපිත කර ඇති ඒකකය වන්නේ ,

i) සැන්හෙඩ්‍රින් සභාවය
ii) අධිකරණ මණ්ඩපයය
iii) සභා සම්මේලනයය
iv) සිනයෝගයය

17) කිතුනු ශිෂ්‍ය නායකයකුගේ කාර්යභාරය ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයෙන් ඉස්මතු කරන අවස්ථාවකි ,

i) කානාහි සරණ මංගල්‍ය
ii) දුක් විඳීමට ලක්වීම
iii) ශ්‍රාවකයන්ගේ පාද සේදීම
iv) නාසරෙත්හි දේශනය

18) වියළි අත්තික්කා ගස පිළිබඳ සිද්ධියෙන් අපට ලැබෙන පණිවුඩය වන්නේ,

i) ඉපදුණු සැමදෙනම නැසෙන බවය
ii) යාච්ඤාවෙන් අයදින කවර දෙයක් වුවද ලැබෙන බවය
iii) පාපිෂ්ඨ බවට ගැළවීමක් නොමැති බවය
iv) ඇඳහිල්ලෙන් ඵල දැරිය යුතු බවය

19) ජායිරස්ගේ දියණිය උත්ථාන කිරීමේ සිදුවීම තුළින් ප්‍රකාශ වන්නේ,

i) ජයිරස්ගේ විශ්වාසය ආදර්ශයට ගතයුතු බවය.
ii) තරුණ පිරිස ගැන ජේසුස් වහන්සේ තුළතිබූ දයානුකම්පාවය.
iii) ජීවනදායක දේවබලය ජේසුස් වහන්සේ වෙත ඇති බවය.
iv) ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන්ගේ ඉල්ලීම ඉටුකරන බවය.

20) ජේසුස් වහන්සේ අපගේ ශාරීරික හා ආධ්‍යාත්මික පෝෂණය පිළිබඳ සැලකිලිමත් වන බව දැක් වෙන්නේ

i) පතස් දහසකට කන්නදීමේ ප්‍රාතිහාර්යයෙනි
ii) වතුර මිදි යුෂ කිරීමේ ප්‍රාතිහාර්යයෙනි
iii) පේදුරු දියඹට ගොස් මසුන් ඇල්ලීමේ සිද්ධියෙනි
iv) අන්තිම රාත්‍රී භෝජනයෙනිත්

21) මිනිසා හා දෙවියන් වහන්සේ අතර සබඳතාව දක්වන පනත් ගණන වන්නේ

i) හයකි
ii) දහයකි
iii) සතරකි
iv) පහකි

22) සෙනඟට බර වූ විය දණ්ඩ කඩා දමා විමුක්තිය උදා කිරීම ගැන දිවැසි වදන් පැවසුවේ ,

i) මීකා
ii) ජෙරමියා
iii) ආමොස්
iv) යෙසායා

23) එඬේර සේවයේ සිටියේදීම දෙවියන් වහන්සේ තෝරා ගත් තැනැත්තා,

i) දානියෙල්
ii) දාවිත්
iii) ජෙරමියා
iv) සිමොන්

24) "උන්වහන්සේ අපගේ දුබලකම් දරාගත් සේක. අපගේ රෝග දුක් බර උසුලා ගත්සේකැයි "

යෙසායාතුමා පවසන වදන් සඳහන් වන සුභාරංචිය වන්නේ,

i) මතෙව් සුභාරංචිය ii) මාක් සුභාරංචිය iii) ලූක් සුභාරංචිය iv) ජොහාන් සුභාරංචිය

25) ……………….. ඉමක් නැත. බලාපොරොත්තුවට ……….. නැත. මෙහි හිස්තැනට සුදුසු වන්නේ,

i) නපුර හා ප්‍රීතිය ii) නපුර හා ඉමක්

iii) විශ්වාසය හා නිමක් iv) ඊර්ෂ්‍යාව හා නිමක්

26) 'සම්පූර්ණ සාමයී' යන්න හඳුන්වන ග්‍රීක වචනය වන්නේ,

i) ශාලෝම් ii) අයිරේනියා iii) කොයිනොයියා iv) අපෝස්ටොලොයි

27) වෛරය හා මිථ්‍යාවබෝධය පැරදවිය හැක්කේ හුදු ප්‍රේමයෙන්ම නොව සතුරන්ට ප්‍රේම කිරීමෙන් හා සමාව දීමෙන් පමණක් බව තම කෘතිවලින් ප්‍රකාශ කර ඇත්තේ,

i) තිස්ස බාලසූරිය පියතුමා ii) දෙවන ජුවාම් පාවුළු පාප්වහන්සේ

iii) චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා iv) ඇලොසියස් පිරිස් පියතුමා

28) දෙවන ජුවාම් පාවුළු පාප්වහන්සේ තමාට වෙඩි තැබූ පුද්ගලයාට සමාව දානය කරමින් පැවසූ වදන වන්නේ,

i) "මොවුන් නොදැන කරන වරදට සමා වුව මැනව"

ii) "ඔබ කළ වරදට මම සමාව දෙමි "

iii) "පියාණෙනි මොන් කරන වරදට සමා වුව මැනව"

iv) යන්න තවත් පව් නොකරන්න"

29) මිදීවැලට පැහී සිටින්නාක්මෙන් සබඳතාවයකට ගැන අපට පවසන්නේ,

i) දෙවියන් වහන්සේ සමඟ සමගියකට පත්වීමට ය.

ii) ජේසුස් වහන්සේ සමඟ සමගියෙන් සිටීමය.

iii) ජේසුස් වහන්සේ සමඟ ප්‍රේමයෙන් බැඳීසිටීම ය.

iv) දෙවියන් වහන්සේ ට කීකරුව සිටීම ය.

30) පෞද්ගලික බලාපොරොත්තු ඉවත දමා දෙවියන් වහන්සේ ඔවුන්ට ඇති කළ බලාපොරොත්තුව කෙරෙහි රැඳෙමින් ක්‍රියා කළ දෙදෙනා,

i) ආදම් හා නෝවා ii) කායින් හා ආබෙල් iii) ආබ්‍රහම් හා මෝසෙස් iv) නයෝමි හා රූත්

31) පෙන්තකොස්ත දින සභාවට එකතු වූ ගණන වන්නේ,

i) 3000 ii) 2000 iii) 4000 iv) 5000

32) සහනාධාර සේවයට තෝරා ගත් උපස්ථායකයින් අතරින් ප්‍රධානියා වන්නේ,

i) පිලිප් ii) පේදුරු iii) පාවුල් iv) ස්තෙපන්

33) අපෝස්තුළුවරුන් විසින් සිදු කරන ලද ප්‍රථම සුවකිරීම,

i) බෙතෙස්දා පොකුණ ලඟ සිටි කොර මිනිසා සුව කිරීමයි.

ii) සුදර්ශන දොරටුව අසල උපන් දා පටන් කොරව සිටි මිනිසා සුව කිරීමයි.

iii) ගෙනසරෙනේ අශුද්ධ ආත්මයෙන් පීඩාවට ලක්ව සිටි මිනිසා සුව කිරීමයි.

iv) ලූස්ත්‍රාවේ සිටි මව්කුසේ පටන්.කොර වූ මිනිසා සුව කිරීමයි.

34) සභාවට එකතු වූ අන්‍ය ජාතික රාජ්‍යය නිළධාරියා වන්නේ,

i) කොර්නේලියස් ii) පාවුල් iii) බාර්ණබස් iv) බර්තලෝමේවුස්

35) කිතුනුවන්ට පීඩා කරන්න ලිපියක් රැගෙන ගිය තරුණයා

i) ස්තෙපන් ii) දෙමෙත්‍රියස් iii) සාවුල් iv) උත්තම පූජක කයාපස්

36) පාවුල්ට ශුද්ධාත්මයාණන් කරණකොට ගෙන සුවය දුන්නේ

i) අනනියස් ii) දෙමෙත්‍රියස් iii) මෝසෙස් iv) බාර්ණබස්

37) දමස්කයේදී අනනියස්ට පාවුල්ව හඳුන්වා දෙනු ලැබුවේ මෙසේ

i) පව්කරුවෙකු ලෙස ii) සැන්හෙන්ද්‍රියන් සභාවේ සමාජිකයෙක් බව

iii) ජේසුස් වහන්සේ තෝරාගත් භාජනයක් බව iv) කිතුනුවන්ට පීඩා කරන දාමරිකයෙක් බව

38) සාවුල් යන්නෙහි ග්‍රීක වචනය

i) පේදුරු ii) යොහාන් iii) පාවුල් iv) පිලාත්

39) පාවුල්තුමා උගත් හස්ත කර්මාන්තය

i) මැටි කර්මාන්තය ii) වඩු කර්මාන්තය iii) කොහු කර්මාන්තය iv) කූඩාරම් කර්මාන්තය

40) පළමු වෙන්ම '**ක්‍රිස්තියානි**' යැයි පැවසූ ස්ථානය

i) කොරින්තිය ii) ත්‍රෝවසය iii) අන්තියෝකිය iv) ක්‍රිතියේදිය

ලකුණු 40 x 1 = 40

සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | ක්‍රිස්තියානි ආගම II පත්‍රය<br>கிறிஸ்தவம் வினாத்தாள்-II<br>Christianity Paper II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |
|---|---|---|

සැලකිය යුතුයි

**පළමු වන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න 4ක් ඇතුළු සියලුම ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න**

1) <u>අනිවාර්ය ප්‍රශ්නය</u>

i) "මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය මොහුට සවන් දෙන්න". මෙහි අවස්ථා සම්බන්ධය ලියන්න.

ii) නසරිය විනය යනු කුමක්ද?

iii) ජේසුස් වහන්සේ සමඟ පෞද්ගලික සම්බන්ධතා ඇතිකරගත් පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න.

iv) ජේසුස් වහන්සේගේ ඉගැන්වීමේ ක්‍රම වේදයන් නම් කරන්න

v) ජේසුස් වහන්සේ පැවසූ ප්‍රේමයේ ක්‍රියාවලියේ මිණුම් දණ්ඩ ලියා දක්වන්න.

vi) ජුදෙව්වන් හා විජාතීන් අතර තිබූ වෛරය ඇති කළ මැද බිත්තිය කඩා දැමුවේ කෙසේද?

vii) පාවුල් තුමා තාර්සස් නුවර ඉපදීම නිසා ලද වරප්‍රසාද මොනවාද?

viii) ක්‍රියා පොතේ කොටස් 2ක හඳුන්වන්න.

ix) මුල් කිතුණු සභාවේ ලක්ෂණ මොනවාද?

x) වත්මන් සමාජය තුළ දරුවන් මුහුණ දෙන හිංසන හා පීඩන 2ක් ඉදිරිපත් කරන්න.

ලකුණු 10 x 2 = 20

(2) i) ජේසුස් වහන්සේට විරුද්ධවූ ජන කණ්ඩායම් කවරේද? 2

ii) ඒ ඒ අය උන්වහන්සේට විරුද්ධව නැගූ චෝදනා මොනවාද? 3

iii) අද සමාජයේ අප අතර වෙසෙන එවැනි කණ්ඩායම් කවුද? එම කණ්ඩායම් වලින් ඔබට එල්ල වන අභියෝග පැහැදිලි කර ඔබ කිතුනුවකු ලෙස එවැනි අභියෝග හමුවේ ක්‍රියා කරන අයුරු විස්තරාත්මකව ලියා දක්වන්න. 5

3) i) ''වග වලසුන් මැදට බැටළු පැටවුන් යවන්නාක් මෙන් යවමි.'' මෙහි අවස්ථා සම්බන්ධය ලියන්න. 2

ii) මෙහි සඳහන් බැටළු පැටවුන් ලෙස තෝරා ගත් අයට දුන් උපදෙස් 3 ක් ලියන්න. 3

iii) දේව රාජ්‍යයේ සේවය සඳහා බැටළු පැටවුන් ලෙෂ කැඳවන කිතුණු අපට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න. 5

4) i) දේව රජ්‍යයේ පුරවැසියන්ගේ චරිත ලක්ෂණ 2ක් ලියන්න. 2

ii) දේව රාජ්‍යයේ පුරවැසියන්ට අනතුරු ඇඟවීම පිණිස ජේසුස් වහන්සේ වදාළ උපමාවක් කෙටියෙන් ලියන්න. 3

iii) දේව රාජ්‍යය මිහිපිට ස්ථාපිත කිරීමේ වගකීම සතුව ඇති අප අද එය නිවැරදිව ඉටු කරනවාද? එසේනම් කෙසේද? වගකීම පැහැර ඇත්නම් එයට හේතු කවරේද? නිදසුන් සහිතව පැහැදිලි කරන්න. 5

5) "මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා"

i) මෙසේ ජේසුස් වහන්සේ පැවසුවේ කුමන අවස්ථාවේ ද? මෙම ප්‍රකාශයෙන් අද අප මුහුණපාන අභියෝග අභිබවා යෑමට උපකාර වන්නේ කෙසේද? 2

ii) ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය අවස්ථාවේ සිටි පුද්ගලයින් තිදෙනෙක් නම් කර ඔවුන් එම අවස්ථාවේ දැක් වූ ප්‍රතිචාර ඉදිරිපත් කරන්න. 3

iii) ජේසුස් වහන්සේගේ උත්ථානයේ සුපුවත එද මුල් අනුගාමිකයින්ගේ ජීවිත වෙනස් කළාක් මෙන් අද කිතුනු අපගේ ජීවිත කෙරෙහි බලපාන්නේ කෙසේද? 5

6) i) එඬේරා සතු කාර්යය භාරය කුමක්ද? 2

ii) ජේසුස් වහන්සේගේ ජීවිතයෙන් එඬේර කාර්යයභාරය ඉටු වූ අවස්ථා 3ක් දක්වන්න. 3

iii) වත්මන් සමාජයට එඬේර සේවය අවැසි වන්නේ ( අවශ්‍ය) කෙසේදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. 5

7) පහත සඳහන් මාතෘකා අතරින් මාතෘකා 2 ක් පිළිබඳව කෙටි සටහනක් ලියන්න.

- පාවුල් තුමාගේ හැරීම
- මුල් ශ්‍රාවකයන් කැඳවීම
- ප්‍රේම පාරමිතාව
- සාමයේ කුමාරයාණන් ලොව පහළවීම
- කිතුනු මෙහෙවරට කාන්තා දායකත්වය

2 x 5 = 10